# මිහින්තලය ධාතු ගර්භ චිත්‍ර තුළින් නිරූපිත සමකාලීන මහායාන ඇදහිලි පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක්

**තුෂිර කේ.එස්,[1] නවරත්න එස්.ඒ.එල්.අයි,[2] හර්ෂණ පී.එල්.සී.[3]**

මිහින්තලය ධාතු ගර්භ චිත්‍ර තුළින් නිරූපිත සමකාලීන මහායාන ඇදහිලි පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මිහින්තලය ධාතු ගර්භ චිත්‍ර උදෙසා මහායානය මගින් සිදු කළ බලපෑම හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මිහින්තලය තත් සිතුවම් විෂයෙහි මහායානිකයන් මගින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙහිදී අධ්‍යන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යනය හා ක්ෂේත්‍ර අධ්‍යනය සිදුවූ අතර ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡා කිරීම මෙහි ක්‍රමවේදය වෙයි. ''බෝසතුන් සහිත අප්සරාවන්'' මෙම සිතුවම් තුළින් නිරූපිත බව පිළිගත් මතයකි. එම අදහස තව දුරටත් විමසා බැලුවහොත් මෙම සිතුවම් හා මහායාන බුදුසමය අතර යම් සබඳතාවයක් පැවතිය හැකිද යන ගැටලුව මෙහිදී පැන නගියි. ඒවා විමසා බැලිය යුත්තේ තත්කාලීන ආගමික ප්‍රවනතාවයන් හා බැඳි වෙනත් සාධක මගිනි. චුල්ලවග්ගපාලියට අයත් සේනාසන ඛන්දකයේ ඡබ්බග්ගිය භික්ෂූන් විසින් විහාරයෙහි චිත්‍රණය කර තිබූ ස්ත්‍රී රූප හා පුරුෂ රූප නිසා විහාර චාරිකාවේ නියුතු මිනිසුන් විසින් භික්ෂූන් හට පරිභව කරන ලද පුවතක් සඳහන්ව ඇත. මේ අනුව මුල්කාලීනව විහාරය තුළ ස්ත්‍රී, පුරුෂ රූප චිත්‍රණය නොකළ යුතු බවට නීති පැනවී ඇති අකාරයක් ද හඳුනා ගත හැකිය. සමන්තපාසාදිකා විනය අට්ඨ කතාවෙහි ද ස්ත්‍රී හා පුරුෂ රූප ඇඳීම නොකළ යුතු ස්ථාන පිළිබඳව අවධාරණය කර තිබේ. බෝධිසත්ත්ව සංකල්පයට ප්‍රමුඛස්ථානයක් ලැබුණු මහායාන දර්ශනය තුළ ස්ත්‍රී රූප ප්‍රතික්ෂේප කිරීමක් දක්නට නොලැබේ. ක්‍රි.ව 05-10 සියවස් අතර මහායාන අදහස් ලක්දිව බෙහෙවින් පැතිර ගොස් ඇත. විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡා වන තත් සිතුවම් දැකිය හැකි මිහින්තලා පුදබිම මධ්‍ය හා පශ්චාත් ඓතිහාසික සමයන් අතරතුර මහායාන බලයට නතු වූ බවට සාධක පවතී. මිහින්තලයෙන් හමුවන ක්‍රි.ව 07-08 සියවස්වලට ගැනෙන සංස්කෘත ලිපිය සුප්‍රකට මහායාන සංකල්පයක් ගුරුකොට ගත්තකි. ක්‍රි.ව 05-07 සියවස්වලට අයත්විය හැකි ගොනාගොල්ල, කරඹගල හා කුඩගල යන ස්ථානයෙහි නිරූපිත සිතුවම් මගින් බෝධිසත්ත්වයන් නිරූපණය වෙතැයි අදහස් ගොඩනැගී ඇත. මෙම සාධක දෙස බලනවිට මිහින්තලා ධාතු ගර්භ සිතුවම්හී කාල අවකාශය, ශෛලිය අතින් මෙන්ම සංකල්ප අතින් ද අනෙකුත් සිතුවම් හා සමාක්ව පැවතීමට ඉඩ ඇත. මිහින්තලා සංස්කෘත ලිපිය ක්‍රි.ව 07-08 සියවස්වලට ගැනෙන නිසාත් ධාතු ගර්භ සිතුවම්හී කාල වකවානුව ඒ කාල පරාසයටම යන බැවින් මෙම සිතුවම් උදෙසා මහායාන ආගමෙහි යම් බලපෑමක් එල්ල වන්නට ඇති බව සිතිය හැකිය. එ නිසා මිහින්තලා ධාතු ගර්භ සිතුවම් උදෙසා වස්තු විෂය ලෙස මහායානික මතවාදයක් වන බෝධිසත්ත්ව සංකල්පය ගුරුව ඇති බව මනාව සනාථ වේ.

**ප්‍රමුඛ පද :** බෝධිසත්ත්ව, අප්සරාවන්, චුල්ලවග්ගපාලිය, ඡබ්බග්ගිය, භික්ෂුව

[1,2,3] සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. shehanthushira@gmail.com